# සෞඛ්‍ය අමාත්‍යාංශය
# දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

## තනතුරු පුරප්පාඩු - සාමාන්‍යාධිකාරි (HM 1-1)
## ද්විතීක පදනම මත

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ සාමාන්‍යාධිකාරි තනතුර සඳහා **ද්විතීක පදනම මත රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.** මෙම තනතුර සඳහා අයදුම් කිරීමේදී, අයදුම්කරුවන් (ඔහු හෝ ඇය) මෙම තනතුර සඳහා සුදුසුකම් ලදහොත් දැනට සේවයේ නියුතු ස්ථානයෙන් මුදා හැරිය හැකි බවට ස්වකීය අමාත්‍යාංශයේ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සනාථ කර අයදුම්පත එවිය යුතුය.

අයදුම්කරුවන් ස්වකීය සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ඇතුළත්ව තමන් විසින් සකස් කරගන්නා ලද ජීව දත්ත පත්‍රිකාවක්, අදාළ අධ්‍යාපන සහ පළපුරුද්ද සහතික කරන ලද සහතික පත්‍රවල පිටපත් සමඟ, **"සභාපති, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, 11 වන මහල 'ඒ', සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල"** යන ලිපිනයට **2023 / 10 / 24** දින හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් / තමා විසින් ගෙනැවිත් භාරදීම හෝ විද්‍යුත් තැපෑලෙන් (විෂය තීරුවෙහි ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර) එවිය යුතුය. ලියාපදිංචි තැපෑල මගින් යොමු කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම / නොගැනීම සම්බන්ධව සියලුම බලතල දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සතුය.

| සාමාන්‍යාධිකාරි -තනතුරු 01 (HM 1-1) | |
|---|---|
| අධ්‍යාපන හා වෘත්තීමය සුදුසුකම් | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වෛද්‍ය, විද්‍යා, කළමනාකරණ හෝ පරිපාලන උපාධියක් ලබා තිබීම.<br>සමග<br>තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය ලබා තිබීම.<br>සහ<br>රාජ්‍ය සේවයේ, සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම. |
| වයස් සීමාව | 2023 / 10/ 24 දිනට අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. |
| වැටුප් පරිමාණය | **HM 1-1** තනතුරට අදාළ වැටුප් හා දීමනා හිමිවේ (2016.10.21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි විධිවිධාන වලට අනුවය) |
| රැකියාවේ ස්වභාවය | ද්විතීක පදනම මත |

**සභාපති**
**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**
**11 වන මහල "ඒ"**
**සෙත්සිරිපාය දෙවන අදියර**
**බත්තරමුල්ල**
**දු. අං. - 0112187140 ෆැක්ස් - 0112186024**
**විද්‍යුත් තැපෑල - natamoh.lk@gmail.com**
**වෙබ් පිටුව - www.nata.gov.lk**
**18/09/2023**

## Ministry of Health
## National Authority on Tobacco and Alcohol

# Vacancy – General Manager (HM 1-1) On a Secondment Basis

The National Authority on Tobacco and Alcohol (NATA) under the Ministry of Health invites applications for the **post of General Manager on a secondment basis from government officers who are qualified for this post.** While applying for this post, the application should be certified by the Secretary of the Ministry or the Head of the Department so that the concerned applicant can be released from the existing post.

Applicants should send their applications with copies of educational qualifications, experience and relevant personnel details to reach the "**Chairman, National Authority on Tobacco & Alcohol, 11th Floor, Wing A, Sethsiripaya Stage II, Battaramulla**" on or before **24th October 2023** via registered post or email. The post applied for should mention the applying post on the top left-hand corner of the envelope.

National Authority on Tobacco & Alcohol Board reserves to itself the right to make or not make an appointment.

| General Manager (HM 1-1) | |
|---|---|
| **Educational and Professional Qualifications** | A Bachelor's degree in Medicine / Science / Management or Administrationfrom a university recognized by the University Grants Commission.<br>WITH<br>A Postgraduate Degree qualification (Masters') in the relevant field or Associate Membership of a recognized professional Chartered Institute, which is relevant to the subject area of the post<br>AND<br>Minimum of fifteen (15) years' experience at a "Managerial Level" in a post of a Government, Government Corporation, Statutory Board/Institution, or a reputed private institution. |
| **Age limit** | Not less than 35 years and not more than 55 years as on 24/10/2023 |
| **Salary scale** | HM 1-1 Salary and allowances will be paid as per provisions of Management Services Circular No. 02/2016 dated 21.10.2016 |
| **Basis of the job** | On a secondment basis |

**Chairman**
**National Authority on Tobacco & Alcohol (NATA)**
**11th Floor, Wing A**
**Sethsiripaya Stage II, Battaramulla**
**Call – 0112187140**
**Fax – 0112186024**
**Email – natamoh.lk@gmail.com**
**Web – www.nata.gov.lk**
**18/09/2023**